මැහිඇල්ලෑවේ අපේ කුඹල්කරුවෝ

(අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රදෙශයේ මැටි මෙවලම් කර්මාන්තයෙහි යෙදෙන සාම්ප්‍රදායික ශිල්පීන් පිළිබඳව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්)

නිමේෂා නිල්මිණි තෙන්නකෝන්[49]

ස්වභාවධර්මය වෙත තිබුණු අවනතභාවයෙන් මිදී නවමු නිර්මාණ ඔස්සේ ස්වභාවධර්මය ජය ගැනීමට මානවයා උත්සාහ දරන්නේ අලුත් ගල් යුගයේ හෙවත් අදින් වසර 12,000කට පමණ පෙර වූ නවශිලා යුගයේ දී ය. මානවයා විසින් ශාක හා සත්ත්ව ගෘහකරණයත්, තාක්ෂණයේ කැපී පෙනෙන වෙනස් වීමත් යන කරුණු මෙම යුගයේ විශේෂත්වයන් වේ. කැපී පෙනෙන තාක්ෂණය යටතේ; ඔපදැමූ ගල් ආයුධ භාවිතය, මැටි බඳුන් නිර්මාණය කිරීමේ තාක්ෂණය, ආහාර ගබඩා කිරීමේ තාක්ෂණය, ආහාර සකස් කිරීමේ තාක්ෂණය, ගෘහ නිර්මාණ ශිල්පය දියුණු කිරීම මෙන් ම ලෝහ භාවිතය යනා දී කරුණු විශේෂ වේ. මැටි බඳුන් නිර්මාණය කිරීමේ තාක්ෂණය ආරම්භ කිරීමත් සමඟ වර්ණ ගන්වන ලද හා කැටයම් දමන ලද සියුම් මතුපිටක් ඇති වළං භාවිතයට ඇති කැමැත්ත වැඩි වීම, අතින් වළං නිර්මාණය කිරීම අඩුකර ඒ සඳහා කුඩා ප්‍රමාණයේ සකපොරුව කුඩා රෝද යොදාගෙන සියුම් ලෙස වළං නිර්මාණය කිරීම හා ගින්දර භාවිත කරමින් වළං පිළිස්සීමට කැමැත්තක් දක්වීම මෙම යුගයේ වැදගත් වේ. නවශිලා යුගයේ ඇරඹි එම මැටි බඳුන් නිර්මාණ තාක්ෂණයේ කාලානුපිළිවෙළ ගොඩනැංවීමේ දී සාහිත්‍යයමය තොරතුරු හා පුරාවිද්‍යාත්මක අවශේෂ ඇසුරෙන් එය මූල හා මුල් ඓතිහාසික යුගවල අඛණ්ඩ භාවිතයක් පෙන්නුම් කරමින් ක්‍රමයෙන් වර්ධනය වී අවම වශයෙන් යටත් විජිත අවධිය දක්වා පැමිණ ඇති බව පෙනේ. වළං කර්මාන්තයේ නියුතු වූවන් වෙනම ම කුලයක් ලෙස අනාදිමත් කාලයක සිට හැඳින්වූවත් ශිල්පීය ශ්‍රේණියක් ලෙස ඔවුන්ගෙන් මානව සමාජයට ඉටු වූ සේවය සුළුපටු නොවන බව දක්විය හැකි ය. එහෙයින් පුරාණ කර්මාන්තයන්ගෙන් කුඹල් කර්මාන්තයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. වළං කර්මාන්තය ආශ්‍රිතව වර්තමානයේ මැටි ඇඹරීම, සකපෝරුව ක්‍රියාකරවීම ආදිය සඳහා නූතන තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතයට ගෙන තිබුණ ද තවමත් නොනැසී පවතින සාම්ප්‍රදායික ක්‍රමවේදයන් අතීත වළං කර්මාන්ත පිළිබඳ දෘශ්‍යමාන සාධක සපයයි. සාම්ප්‍රදායික මැටි බඳුන් කර්මාන්තය පදනම් කරගත් පාරම්පරික ශිල්පීන් වාසය කරන ඓතිහාසික පසුබිමක් සහිත එබඳු වූ ග්‍රාමයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රදේශයේ පිහිටා ඇති "මැහිඇල්ලෑව" ග්‍රාමය හැඳින්විය හැකි ය. එකී ග්‍රාමයේ වත්මනේ පවතින ජීවනෝපාය ක්‍රමය, ඥාති සබඳතා, විවාහ කටයුතු, මැටි බඳුන් කර්මාන්තය හා සම්බන්ධ සිරිත් විරිත් මෙන් ම මැටි බඳුන් නිර්මාණය හා ශිල්පීය ක්‍රම යන කරුණු මුල්කරගෙන සිදුකරනු ලබන මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනය ඔස්සේ අතීතයේ එකී කාරණා සිදු වූ ආකාරය පිළිබඳව යම් බඳු වූ අදහසක් ලබාදීමට මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් අදහස් කරමි.

ප්‍රමුඛ පදඃ මානවවංශ විද්‍යාව, මැටි බඳුන්

[49] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, nimeshanilmini93@gmail.com.